

# කොළඹ සිට ඕපනායකට, අසිරිමත් පුංචි කෝච්චියේ
# අමතක නොවන ගමනක් .........




විශ්ව විද්‍යාලයයේ උද්භිද විද්‍යා තුන්වන වසරේ (1963) සිසුන් වන අපට ක්ෂේ ත්‍රයෙන් සොයාගත් ශාක එකතුවක් (Herbarium) සකස් කිරීම අනිවාර්ය කර තිබුණි. අවසාන විභාගයේදී වැඩිපුර ලකුණු දහයක් ලබාගැනීම සඳහා මෙය පහසුම ක්‍රමයක් වූ නිසා කවුරුත් එයට උනන්දු වුහ. මේ සඳහා පැලෑටි එකතු කර ගැනීම පිණිස නගරයෙන් ඈත ප්‍රදේශයකට යාම අවශ්‍ය විය. රත්නපුර දිස්ත්‍රික්කයේ ඈත ගම් පලාතකට ගියහොත් අපගේ අවශ්‍යතාව සඳහා අවශ්‍ය පැළෑටි පහසුවෙන්ම සපයා ගත හැකි බව අතපත්තු කීවේය.

"ඕපනායක කියන ගම තියෙන්නේ රත්නපුරයේ බලන්ගොඩ පැත්තේ නේද? ඒ ගමේ ඉස්කෝලේ ලොකු මහත්තයා අපේ ගෙවල් කිට්ටුව කෙනෙක්. අපේ තාත්තාගේ හිතවතෙක්. අපට ඒ පැත්තේ යතොත් විදුහල්පති මහත්මයාගෙන් උදව්වක් ගන්නට හැකිවෙයි" යයි මම කීවෙමි.

"ඕපනායක නේද පුංචි කෝච්චි යන, කැලණිවැලි ලයින් එකේ අන්තිම ස්ටේෂන් එක?" කියමින් පතිරාජද අපට එකතුවිය.

"මම හිතන්නෙත් ඕපනායක තමයි අන්තිම ස්ටේෂන් එක. ඒක මැප් එකකින් ලේසියෙන්ම සොයා ගන්නට පුළුවන්. එහෙනම්, කොහොම වෙතත්, අපි රට තොට බලන්නත් එක්ක කෝච්චියෙන් යමු" මම යෝජනා කළෙමි.

ඊළඟ සති අන්තයේදී මා ගෙදර ගියවිට අපේ අසල් වැසියෙකු වූ අමරසේන ලොකු මහත්මයාද ගෙදර පැමිණ ඇති බව දැනගන්නට ලැබිණ. ඔහු හමුවූ මා අපේ අවශ්‍යතාව ගැන කී විට, ඔහු ඉතාමත් සතුටු විය. ඔහුගේ පාසල කිට්ටුවම, ලඳු කැලෑවක් සහිත "දන්දෙනිය එස්ටේට්" නම් රබර් වත්තක් තිබෙන බවත්, වතු පාලක වරයාද තමන් හඳුනන බවත් ඔහු කීවේය. අප තුන්දෙනාට පාසලේම නවාතැන් ගත හැකි බවත් ඔහුගෙන් දැනගන්නට ලැබිණ.

"කෝච්චියේ නම් කොළඹ සිට ඕපනායකට යන්න එන්නම දවස් දෙකක් ගතවෙනවා" යයි අතපත්තුගේ මාමා කෙනෙක් කියා තිබිණ.

එසේ මග දිගට කාලය ගතවීම අපට තවත් ඉතාමත් හොඳ සොඳුරු අත්දැකීමක් විය හැකි බවත්, නගරයෙන් පිට ඈත පිටිසර ස්වභා සෞන්දර්යය රිසිසේ අත්විඳීමට එය මහඟු අවස්ථාවක් විය හැකි බවද මම සිතුවෙමි.

සති දෙකකට පමණ පසු එළඹෙන සිකුරාදා දින අප දුම්රියෙන් එන බව අමරසේන මහතාට ලිපියකින් දැන්වීමි.

අපේ ක්ෂේත්‍ර ක්‍රියාකාරකමට අවශ්‍ය ප්ලාන්ට් ප්‍රෙස් (plant press) සහ "වස්කියුලම්" (vasculum) උපකරණ, ෆෝමලින්, ඩැහි අඩු ආදිය විද්‍යාගාරයෙන් ලබාගෙන අපි තුන්දෙනා ගමනට සුදානම් වූවෙමු.

මරදානෙන් දුම්රිය පිටත් වීමට තිබුණේ පෙරවරු හත පසුවී විනාඩි විස්සටය. මෙය ඕපනායකට පැමිණෙනුයේ සවස පහට පමණ බව දැනගන්නට ලැබිණ. අප තිදෙනාට දහවල් ආහාරය සඳහා බත්මුල් තුනක් සාදා දීමට අතපත්තුගේ මව කැමති වුවාය.

සිකුරාදා තිබුණු ටියුට් ක්ලාස් එක මග හැරදමු අපි අපේ ගමනට පිටත් වීමු. අතපත්තුගේ මව විසින් සකස් කර කොලපත්වල ඔතා එවා තිබුණු බත්මුල් අපගේ ගමන් මලු වලට දමා කරේ එල්ලාගෙන අනිත් උපකරණද රැගෙන මරදාන දුම්රියපළට ගියෙමු.

ප්‍රවේශ පත්‍ර නිකුත් කරන කාර්යාලයට ගොස් ඕපනායකට ප්‍රවේශපත්‍ර ඉල්ලා මුදල් නෝට්ටු කිහිපයක් දුන් විට, තම උපැස් යුවළ ඉහලට ඔසවා නළල රැලිකර අප දෙස බැලූ එහි සිටි වයෝවෘධ නිලධාරියා,

"මෙච්චර බස් තියෙද්දි ඕපනායකට කෝච්චියෙන් යන්නේ මොකද? කෝච්චිය ප්‍රමාද උනොත් ඕපනායකට යනකොට රෑ වෙයි. සමහර දාට රෑ දහය දොළහත් වෙනවා" කියමින් ප්‍රවේශ පත්‍ර නිකුත් නොකර අපගෙන් පිළිතුරක් බලාපොරොත්තුව සිටියේය.

"අපි අද රෑට ඕපනායක ඉස්කෝලේ නතර වෙනවා. එහෙ ලොකු මහත්මයාට අපි එන බව දන්වලා තිබෙන්නේ" කී විට, ඔහු කොටසක් පමණක් මුද්‍රණය කර තිබුණු, හිස් ටිකට් පත් කිහිපයක් සොයාගෙන ඒවායේ "කොළඹ - ඕපනායකි" කියා අතින් ලියා මුදලද සඳහන් කර අපට දුන්නේය.

කොළඹ සිට ඕපනායකට දුම්රියේ යන මගීන් නොමැති නිසාදෝ මුද්‍රිත ප්‍රවේශ පත්‍ර පවා නොමැති බව අප දැනගත්තේ එවිටය.

"ඉලන්දාරි තුන්දෙනාට සුබ ගමන්" කියා ඔහු අපට විහිලුවක්ද කළේය.

එක් අයකුට ප්‍රවේශ පත්‍රයේ ගාස්තුව රුපියල් පහයි ශත හතළිහක් විය.

දුම්රිය අංගනයේ අවසාන පේලියේ නවතා තිබුණු පුංචි කෝච්චියට අපි ගොඩ වූයෙමු. ඉතාමත් පටුවට ඇති රේල් පීළි දෙක උඩ තිබුණු දුම්රිය, සෙල්ලම් කෝච්චියක් මෙන් දිස්විය. එහි මගී මැදිරි හතරක් සහ බඩු ගෙනයන මැදිරි රාශියක් විය. දුම්රිය වේදිකාවද මිටිය. අපි හිස් මැදිරියක එකතැන ආසන වල හිඳ ගතිමු. මාළු පෙට්ටි කිහිපයක් පටවා ගත් මාළු වෙළෙන්දෙක් සහ ගෝනි මලූ වල ඇසුරු වියලි මිරිස්, අර්තාපල් සහ රට ලූණු ආදිය සමග තවත් වෙළෙන්දෙක්ද අප සිටි මැදිරියට නැග ගත්හ. දුම්රිය පිටත් වීමට විනාඩි දෙකක් පමණ තිබියදී ගොඩවූ කවි කොළ කාරයෙක් වමතින් කන අල්ලාගෙන "ගෙදර පලහිලව්වී නම් බේදවාචකයක් මහ හඬ නගා තාලයට කියවන්නට පටන් ගත්තේය.

"පස්වෙනි වේදිකාවේ තිබෙන දුම්රිය පෙරවරු හතයි විස්සට ඕපනායක බලා පිටත්වේ. මෙම දුම්රිය මරදානේ සිට ඕපනායක දක්වා ඇති සෑම දුම්රිය ස්ථානයකම නතර කරනු ලැබේ" ඒ දුම්රිය පිටත් වීමේ නිවේදනයයි. එය ඉංග්‍රිසියෙන් සහ දෙමළෙන්ද නිකුත් කරන ලදී.

නලාව මහ හඬින් ශබ්ද කර "හොස්....., හොස්...." හඬින් දුම් ගුලි අහසට යවමින් දුම්රිය හෙමින් හෙමින් ඉදිරියට ගමන් කරන්නට විය.

දුම්රිය තුළ කිසි මගී තදබදයක් නොවීය. දුම්රිය ඉදිරියට ගියේ ඉතාමත් සෙමිනි. මරදානේ සිට බේස්ලයින් පාර, නාරාහේන්පිට, කිරුළපන ආදී මග දෙපස නාගරිකයයි සිතූ පරිසරය, අප කිසිසේත් නොසිතූ ආකාරයේ එකක් විය. ඕවල් ක්‍රීඩාංගණය පසුවී කොටාරෝඩ් දුම්රිය පළ දක්වා මග දෙපසම තිබුණේ රේල් පාරට ආසන්නවම තනා ඇති පැල්පත්ය. සමහර පැල්පත්වල වහලය දුම්රියේ ගෑවෙන නොගෑවෙන තරම්ය. බොහෝ පැල්පත් වැසියෝ, දුම්රිය එන බව ගැන කිසිම තැකීමක් නොමැතිව දුම්රිය පාර හරහා ගමන් කළහ. ඔවුනට දුම්රියේ නලාව නොඇසෙන්නාක් මෙන්ය. ඒ නිසා ඒ කොටසේ දුම්රිය ධාවනය වුයේ ඉතාමත් සෙමිනි. එක් අවස්ථාවකදී අවුරුදු දහය දොළහ පමණ වයසේ ගැහැණු පිරිමි ළමයි පිරිසක් සෙමින් දුවන දුම්රියට කලබලයේ ගොඩවුහ. ඔව්හු හැංගිමුත්තං සෙල්ලම් කරන දඟයන් බව අපට දැනුණි. සමහරු දුම්රියට ගොඩවූ විගසම ආසන යට සැඟවුණාහ. සැඟවුණු අය සෙවීමට සිටි දරුවා අපගේ කකුල්ද ඈත්කරමින්, සැඟවුණු අය සොයන්නට වුහ. ටික වෙලාවකට පසු මේ සියලූ දෙනාම ගෝතමී පාර අසලදී දුම්රියෙන් බැස ගත්හ. එය කුඩා දරුවන්ගේ වැයික්කිය බව මම තේරුම ගතිමි. අඟහිඟ කම් දහසක් මධ්‍යයේ වුවද, පෙනෙන තෙක් මානයේ ඇති කෘතිම නාගරික කොන්ක්‍රීට් පරිසරයේ හෝඩුවාවක්වත් නොදන්නා ඔවුන්ගේ අව්‍යාජ හැංගිමුත්තං ක්‍රීඩාව අපි තිදෙනාම අගය කළෙමු.

දුම්රිය පාර හරහා යාමට සිටින පැල්පත්වාසී බොහෝ අයද කරන්නේ, ඉතා සෙමින් ධාවනය වන දුම්රියට ගොඩවී අනිත් පැත්තෙන් බැසීමයි. කුඩා වතුර බාල්දිද අතින් ගෙන සෙමින් ධාවනය වන දුම්රිය හරහා ගොස් අනික් පැත්තෙන් බසින අයද සිටින නිසා ඔවුන්ගේ වැසිකිලි පහසුකම්ද තිබිය හැක්කේ දුම්රිය පාරට අනික් පැත්තේ බව අපට සිතාගත හැකි විය. මෙම වැඩිහිටියන්ද තමන්ට නොමැති පහසුකම් ගැන බලධාරීන්ට කන්කෙඳිරි නොගා ලද දෙයින් සතුටු වන ආකාරය අප සිත් සසල කළේය.

ඒ මිනිසුන්ගේ මේ ගති පැවතුම් අපට මහත් අරුමයන් වුවත් ඒ පැල්පත් වාසීන් හෝ දුම්රිය බලධාරීන් එම සිද්ධීන් සාමාන්‍ය දේවල් ලෙස සිතනවා විය හැකිය.

දුම්රිය විනාඩි විස්සක දී පමණ කොළඹ නගර සීමාව පසුකර තවත් විනාඩි විස්සකදී පමණ නුගේගොඩට ලඟාවිය. ගතවූ සුළු කාලය තුලදී වුවද අපට දකින්නට ලැබුණේ මෙතෙක් කිසි දිනක දැක නොමැති කොළඹ සහ තදාසන්න ප්‍රදේශ වල සැඟවී තිබෙන දරිද්‍රතාවයි.

දුම්රිය නුගේගොඩ සිට පාදුක්ක දක්වා තරමක් වේගයෙන් ධාවනය විය. අප පසුකළ කුඩා නගර ශීඝ්‍රයෙන් අධි නාගරීකරණයට ලක් වෙමින් තිබෙතත්, දුම්රිය මාර්ගය දෙපස තවමත් පැරණි ග්‍රාමීය ගතිය මිස වැඩි මනත් කලඑළියක් දකින්නට නොලැබිණ.

පාදුක්ක දුම්රියපොළේ අතිරේක පථයේ නතර කර තිබුණු පැරණි වාෂ්ප රේල් බස් රථය දුටු අපි මවිතයට පත්වීමු. අප සිත් ඇදගත් එම රේල් බස් රථය, හෝමාගම සිට අවිස්සාවේල්ල දක්වා ධාවනයේ යොදවා තිබුණු, සාමාන්‍ය බස්රථ දෙකක පමණ දිගින් යුක්ත තනි දුම්රිය මැදිරියක් වැනිය. වාෂ්ප එන්ජිමකින් ධාවනය වන එම රේල් බස් රථයද ඉතාමත් විරල අමුතුම වස්තුවක් ලෙස අපට පෙනුණි.

පාදුක්ක පසුවූ පසු ධාවන පථය වංගු සහිත නිසා, නැවතත් ඉබි ගමනින් ගිය දුම්රිය සමහර තැන් වලදී පැයට කිලෝ මීටර් අටක